# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


11-07-2012

## පුවත්පත් නිවේදනයයි !

පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් ඇතුළුව සියළුම වෛද්‍ය නිලධාරීන් අයත් වන වෛද්‍ය සේවාව දිපව්‍යාප්ත සේවයකි. එහෙයින් පළාත් සභා ආයතනයන්හි සේවය කරන වෛද්‍ය නිලධාරීන්ගේද පත් කිරිමේ සහ ස්ථාන මාරු සම්බන්ධ පුර්ණ බලතල ඇත්තේ මධ්‍යම රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වේ.

මේ අනුව මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකධුරය සඳහා මධ්‍යම රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්, අනුමත ජ්‍යේෂ්ඨ වෛද්‍ය පරිපාලන තනතුරු ලැයිස්තුව හරහා අදාළ වු ස්ථාන මාරු ලබා නව නිලධාරිනියක් පත්ව ඇත. එහෙත් දැනට  මධ්‍යම පළාත් දේශපාලන අධිකාරියේ බලපෑම නිසා මෙම නිලධාරිනියට තම සේවය හරියාකාරව සිදු කළ නොහැකි තත්වයක් උද්ගත වී ඇත.

මේ සම්බන්ධව 10-07-2011 දින පැවැත්වු රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ හදිසි විධායක කමිටු රැස්විමේදි පහත තිරණ වලට එළඹිමට යෙදුනි.

1. වෛද්‍ය ස්ථාන මාරු සම්බන්ධව මධ්‍යම පළාත තුළ ඇති වී ඇති මෙම දේශපාලන බලපෑම් පිළිබඳව අපගේ බලවත් අප්‍රසාදය සහ විරෝධතාවය ප්‍රකාශ කිරීම.
2. වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් වශයෙන් අද දින සිට මෙම පළාත තුළ සියළුම සෞඛ්‍ය ආයතන වල සිටින සියළුම වෛද්‍යවරුන් නිත්‍යානුකුලව නව පත්වීම් ලබා ඇති මධ්‍යම පළාත්  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරිය සමඟ පමණක් රාජකාරීමය වශයෙන් කටයුතු කිරීම.

ස්තුතියි.

වෛද්‍ය නලින් ආරියරත්න

සහකාර ලේකම්